**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10 ශ්‍රේණිය**

**4.0 ව්‍යාපාර ගනුදෙනු වාර්තා කරයි.**

**4.2 ගනුදෙනුවල ද්විත්ව බලපෑම ද්විත්ව සටහන් ක්‍රමය අනුව සටහන් කරයි.**

**පැවරුම 02**

1. ලෙජරය යනු කුමක්ද?
2. ව්‍යාපාරයක පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ගිණුම් වර්ග 05 නම් කරන්න.
3. අශාන්ගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මස සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක් වේ.

| | |
|---|---|
| 01.01 | ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා සිංහ ලීබඩු ව්‍යාපාරයෙන් රු 100 000 වටිනා ලී බඩු උපකරණ අත්පිට මුදලට ගැනීම |
| 01.05 | රු 50 000 භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම |
| 01.07 | රු 200 000 බැංකුණයක් ගැනීම |
| 01.08 | ණයහිමියෙක්ට ගෙව්වා රු 30 000 |
| 01.10 | රු 100 000 අමතර ප්‍රාග්ධනයක් යෙදෙව්වා |
| 01.15 | සේවක වැටුප් ගෙව්වා රු 18 000 |
| 01.17 | රු 2500 විදුලිබිල ගෙවීම |
| 01.20 | ණයට විකුණුම් රු 50 000 |
| 01.24 | රු 150 000ක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම |
| 01.27 | ණයගැතියන්ගෙන් රු 45 000 ක් ලැබීම |

අවශ්‍ය වන්නේ

1.ඉහතගනුදෙනුවල ද්විත්ව බලපෑම හා ද්විත්ව සටහන ලියන්න.(පහත ආකෘතිය අනුගමනය කරන්න) උදා-

| ගනුදෙනුව සිදුවූ දිනය | ද්විත්ව බලපෑම | ද්විත්ව සටහන |
|---|---|---|
| 01.01 | | |
| 01.05 | | |
| 01.07 | | |

2.ඉහත සඳහන් ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න

4. තිමිර විසින් තම ව්‍යාපාරයේ 2021 අප්‍රේල් මාසයේ සිදු වූ ගනුදෙනු ඇතුළත්කොට පිළියෙල කර තිබූ මුදල් ගිණුම පහත දැක් වේ.

**මුදල් ගිණුම**

| දිනය 2021 | විස්තරය | ස.පි | වටිනාකම | දිනය 2021 | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 04.01 | ප්‍රාග්ධනය | | 50 000 | 04.02 | උපකරණ | | 10 000 |
| 04.03 | බැංකුණය | | 100 000 | 04.08 | ගැනුම් | | 25 000 |
| 04.10 | විකුණුම් | | 30 000 | 04.15 | විදුලි ගාස්තු | | 3 600 |
| 04.17 | ණයගැතියෝ | | 12 000 | 04.23 | බැංකුණය | | 10 000 |
| 04.25 | පොළී ආදායම් | | 8 000 | 04.28 | ණයහිමියෝ | | 20 000 |

අවශ්‍ය වන්නේ.

1.ඉහත මුදල් ගිණුමේ සටහන් කර ඇති ගනුදෙනු මොනවාද යන්න දින අනුපිළිවෙලට ලියා දක්වන්න.